**ශීර්ෂය 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) වාණිජ අත්තිකාරම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල ශුද්ධ වටිනාකම රු.192,233,776 ක් විය යුතු වුවද එය රු.115,492,778 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම අගය රු.76,740,998 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂවල දී නිවැරදිව අවසාන ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව. | ශේෂ පත්‍රයෙහි පසුගිය වර්ෂයට අදාළ සංසන්දනාත්මක අගයන් නිවැරදිව දැක්විය යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.877,525 ක් වූ ගෙවිය යුතු ශේෂ බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ගෙවිය යුතු ශේෂ නිවැරදි ලෙස බැරකම් ලේඛනයට ඇතුළත් කළ යුතුය. |
| (iii) | 2013 වර්ෂයේ සිට පැවත එන රු.1,650,634 ක මුද්‍රණාල ණය හිමි ශේෂ 04 ක් 2023 අප්‍රේල් 20 දින වන විටත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | දිගු කාලයක සිට පැවත එන ණයහිමි ශේෂ හැකි ඉක්මනින් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (iv) | මුද්‍රණකරුවන් වෙත ගෙවීම් කිරීමේ ලේඛනයේ දැක්වෙන රු.1,763,792 ක් වූ ණයහිමි ශේෂ 06 ක් අනුමත අත්තිකාරම් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂයට ඇතුළත් කර නොතිබුණු අතර මේ හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ණයහිමි ශේෂය නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (v) | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරන ලද 7 ශ්‍රේණියේ දෙවන බස දෙමළ පෙළපොතට අදාළව 2022 මාර්තු 21 දින ගෙවන ලද රු.6,208,462 ක මුදල මුද්‍රණකරුවන් වෙත ගෙවීම් කරන ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ගෙවීම් කරන අවස්ථාවේදීම නිවැරදිව අදාළ ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | අනුමත අත්තිකාරම් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට මුද්‍රණ ආයතන 26 ක් වෙත ගෙවිය යුතු රු.13,450,484,491 ක ණයහිමි ශේෂයන් සනාථ කරගැනීම සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ණයහිමි ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ණයහිමි ශේෂ සනාථ සෘජුවම විගණනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | 2009 වර්ෂයේ සිට නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඩ් වෙතින් අයවිය යුතු රු.7,431,012 ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී ද අයකරගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාළ ආයතනය සමඟ සාකච්ඡා කර අයවිය යුතු මුදල අයකරගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය පියවර ගනු ලබන බව. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (viii) | නියමිත දිනට පෙළපොත් ලබා නොදීම මත මුද්‍රණ ආයතනවලින් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගන්නා ලද දඩ මුදල් රු.1,635,455 ක් ගිණුම්ගත වී නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද ණයහිමි ශේෂය එම අගයෙන් වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | දඩ මුදල් නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත අත්තිකාරම් ගිණුමේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව ස්ථාවර වත්කම් අයිතම 06 ක අගය රු.135,971,166 ක් වූ අතර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය අනුව එම ස්ථාවර වත්කම්වල අගය රු.96,474,071 ක් වූයෙන් රු.39,497,095 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | නිවැරදිව ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී ඇප ලේඛනය සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |

(ඇ) විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දක්වා ඇති රු.92,145,416 ක් වටිනා ඉඩම සහ රු.187,950,284 ක් වටිනා ගොඩනැගිලිවල අගයන් සනාථ කෙරෙන තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ඉදිරියේදී අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ස්ථාවර වත්කම්වල අගය තහවුරු කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 (ඇ) | සෑම මාසයකම බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කර ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් වාර්තා පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම කළ යුතුය. |
| (ii) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය සහ 03(ආ) ඡේදය | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විස්තරාත්මක හා පැහැදිලි ලෙස සකස් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කළ යුතුය. |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතයෙන් e තක්සලාව වැඩසටහන සඳහා 2021 වර්ෂයේදී රු.27,007,620 ක් වැය කරමින් ඩිජිටල් ඉගෙනුම් ආධාරක වීඩියෝ 551 ක් | 2021 වර්ෂයේදී සම්පාදනය කරන ලද වීඩියෝ අතරින් තාක්ෂණික දෝෂ පැවති වීඩියෝ කිහිපයක් 2021 වර්ෂයේදී e තක්සලාවට | මෙම ව්‍යාපෘතියේ අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිෂ්පාදනය කර තිබුණු අතර එයින් වීඩියෝ 431 ක් පමණක් 2022 වර්ෂයේ දී වෙබ් අඩවියට උඩුගත කිරීමට කටයුතු කර තිබුණි. එම උඩුගත කරන ලද වීඩියෝවල එක් වීඩියෝවක සාමාන්‍ය නැරඹුම් වාර ගණන 150 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවති නමුත් 2022 වර්ෂයේදී ද රු.25,473,288 ක් වැයකරමින් e තක්සලාව සඳහා ඩිජිටල් ඉගෙනුම් අධාරක වීඩියෝ 480 ක් නිෂ්පාදනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර 2023 අගෝස්තු මාසය වන විටත් එයින් වීඩියෝ 420 ක් පමණක් වෙබ් අඩවියට උඩුගත කර තිබුණි. | උඩුගත කිරීමට නොහැකි වූ අතර ඒවා නැවත නිවැරදි කර උඩුගත කිරීමට කටයුතු කරනු ලබන බව. | |
| (ආ) | උක්ත ව්‍යාපෘතිය යටතේ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීමේ අරමුණින් 12, 13 ශ්‍රේණිවල පාසල් සිසුන් වෙනුවෙන් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ විද්‍යුත් කියවීම් අත්පොතක් (E-Book) සකස් කිරීමට අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් අනුමැතිය ලබාදී තිබුණද පසුව එය මුද්‍රණය කරන ලද පොතක් වශයෙන් සකස් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුව මෙම පොත් පිටපත් 15,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.7,258,500 ක අමතර මුද්‍රණ වියදමක් දරා තිබුණු අතර 2023 අගෝස්තු මාසය වන විටත් පිරිවැය රු.1,354,920 ක් වූ පොත් පිටපත් 2,800 ක් ගබඩාවේ ඉතිරි වී තිබුණි. | ඉදිරියේදී මෙම පොත් බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | අනුමැතිය පරිදි විද්‍යුත් කියවීම් අත්පොතක් ලෙස පිළියෙළ කළ යුතුව තිබූ අතර මුද්‍රිත පොත් පරිශීලනය කිරීමට අවස්ථාව සලසා දිය යුතුය. |

**2.2** **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උක්ත 2.1(ආ) හි සඳහන් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අතිරේක කියවීම් පොත මුද්‍රණය කිරීම සඳහා සුදුසුකම්ලත් මුද්‍රණාල 35 කින් මිල ගණන් කැඳවා තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ආ) සහ (ඇ) ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටුව පත්නොකිරීම හේතුවෙන් ලංසු ලේඛන කෙටුම්පත් කිරීම, පිරිවිතර සැකසීම් ආදී කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහභාගී වී නොතිබුණි. තවද මෙම ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ආ),(ඇ),(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම පොත් සඳහා මිල ගණන් ලැබීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පෙළපොත් මුද්‍රණය කිරීමට පෙර අකුරු ඇමිණීම, පළමු, දෙවන හා තෙවන සෝදුපත් ඉදිරිපත් කිරීම, පෙරටු පිටපත් 10 ක් ඉදිරිපත් කිරීම සහ මුළු පිටපත් ප්‍රමාණය මුද්‍රණය හා බැඳීම යනාදී කටයුතු සිදු කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන බැවින් පොත් මුද්‍රණය කර ගබඩාවට ලබාදීම සඳහා ගිවිසුම් ගත වූ දින සිට මාස 03ක කාලයක් මුද්‍රණ ආයතන වෙත ලබාදී තිබුණි. එසේ වුවද 2023 වර්ෂය වෙනුවෙන් ගිවිසුම් ගත වූ මුද්‍රණ ආයතන 14 ක් වෙතින් ගිවිසුම් ගත වී මාසයක් ගතවීමට පෙර 2023 ජනවාරි 30 දින වන විටත් පෙළපොත් පිටපත් 3,310,100 ක් ගබඩාවට ලබා දී තිබුණි. කෙටි කාලයක් තුළ පෙළපොත් ගබඩාවට ලබා දීම ප්‍රායෝගික තත්වයක් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | මුද්‍රණාලවල පවතින පහසුකම් අනුව මුද්‍රණයට ගතවන කාල පරාසයේ වෙනස්කම් ඇති අතර ප්‍රමුඛතාවය අනුව මාස 03 ක් තුළ මුද්‍රණය කරන ලද පොත් ගබඩාවට ලබාදීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වී පොත් මුද්‍රණය කර භාරදීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූලව හා ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූලවන පරිදි සිදු විය යුතුය. |

## 2.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු සම්බන්ධයෙන් වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පත් සඳහා මුදල් අයකර ගිණුම්වල තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දී පෙළපොත් පිටපත් 32,890,400 ක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතන 23 ක් සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුම් ගත වී තිබුණ ද පළමු පාසල් වාරය 2023 මාර්තු 20 දින ආරම්භ කරන විට පෙළපොත් බෙදාහැරීමේ මධ්‍යස්ථාන වෙත පොත් 15,645,654 ක් බෙදාදීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම කාර්යක්ෂමව භාවිතා කරමින් දෙපාර්තමේන්තු අරමුණු කරා ළඟාවීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව. | නියමිත කාලයේදී පාසල් පෙළපොත් මුද්‍රණය කර පාසල්වලට බෙදාහැරීම දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් වන බැවින් ඒ සඳහා කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයේ පළමු පාසල් වාරය 2022 අප්‍රේල් 18 දින ආරම්භ කර තිබුණද මුද්‍රිත මුළු පෙළපොත් පිටපත්වලින් සියයට 67 ක් නියමිත කාලයේදී බෙදාහැරීමට නොහැකි වී තිබුණි. | මේ වන විට පෙළපොත් සියයට 83 ක් බෙදා අවසන් කර ඇති බව. | පළමු පාසල් වාරය ආරම්භ කිරීමට පෙර පාසල්වලට පෙළපොත් බෙදාහැරීමේ දෙපාර්තමේන්තු වගකීම ඉටු කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඇ) | පිටිපන A, B හා C ගබඩා ඇතුළත් සම්පූර්ණ පෙළපොත් ගබඩා සංකීර්ණයම ආවරණය වන ආකාරයට CCTV කැමරා පද්ධතියක් සවිකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී **CCTV** කැමරා පද්ධතියක් සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ගබඩා සංකීර්ණයම ආවරණය වන පරිදි **CCTV** කැමරා පද්ධතියක් සවිකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අවශ්‍යතාවය හඳුනාගනිමින් පෙළපොත් මුද්‍රණය කර නොතිබීම හේතුවෙන් 2021 වර්ෂයේදී පෙළපොත් පිටපත් 6,191 ක ප්‍රමාණයක් අපහරණය කර තිබුණු අතර 2017 වර්ෂයේ මුද්‍රණය කරන ලද 10 ශ්‍රේණියේ ව්‍යවසායකත්ව අධ්‍යයනය ඉංග්‍රීසි මාධ්‍යය පෙළපොත් පිටපත් 5,307 ක ප්‍රමාණයක් භාවිතයට ගත නොහැකි මට්ටමක පැවතුණි. | ඉදිරියේ දී වාර්ෂික අවශ්‍යතාවය හඳුනාගෙන පෙළපොත් මුද්‍රණයට අවශ්‍ය සංඛ්‍යාලේඛන සකස් කර ඇති බව. | වාර්ෂික පෙළපොත් අවශ්‍යතාවය හඳුනාගෙන පෙළපොත් මුද්‍රණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතීම, විෂය නිර්දේශ වෙනස් වීම වැනි හේතූන් නිසා 2022 වර්ෂය තුළ අතිරේක කියවීම් පොත් පිටපත් 241,056 ක් සහ ප්‍රශ්නෝත්තර පොත් පිටපත් 162,663 ක ප්‍රමාණයක් භාවිතයෙන් ඉවත්කර තිබුණි. | ඉදිරි වර්ෂය සඳහා අතිරේක පොත් මුද්‍රණයේදී අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණය කිරීමට පියවර ගෙන ඇති බව. | වාර්ෂිකව අතිරේක පොත් හා ප්‍රශ්න පත්‍ර පොත්වල අවශ්‍යතාවය නිවැරදිව තීරණය කර මුද්‍රණය කළ යුතුය. |
| (ඊ) | 2008 වර්ෂයේ ලද අමාත්‍ය මණ්ඩල තීරණ දෙකකට අනුව අපහරණය කරන ලද රු.312,831,071 ක වටිනාකමක් සහිත පොත් 2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු අතර නැවතත් 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත නොහැකි පොත් ලෙස රු.93,420,366 ක් දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණි. | ගබඩා ශේෂය හා නැවත භාවිත ප්‍රතිශතය ගණනය කර 2024 වර්ෂය සඳහා පෙළපොත් අවශ්‍යතාවය ගණනය කර ඇති බව. | වාර්ෂික පෙළපොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුද්‍රණය කළ යුතු පොත් ප්‍රමාණය තීරණය කළ යුතුය. |
| (උ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් හෝමාගම පිටිපන පිහිටි පෙළපොත් ගබඩා සංකීර්ණය ඉදිකර තිබෙන ඉඩම, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නීත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව. | ගබඩා සංකීර්ණය පිහිටි ඉඩම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |